ජනමාධ්‍ය තුළ කාන්තාවන් කොන් කරනා ආකාරයේ වාර්තාකරණයන් විවිධ ආකාරයන්ගෙන් දක්නට ලැබේ. ඊට එක් උදාහරණයක් වන්නේ, යම් කිසි වරදක් සම්බන්ධයෙන් හෝ වරදක් කළ බවට වන සැකයක් සම්බන්ධයෙන් වාර්තා වන පුද්ගල කණ්ඩායමක සිටිනා කාන්තාවන් පමණක් ඉස්මතු කොට දැක්වීමයි. ඒ ඔස්සේ යම් කිසි වරදක් කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශවයම විසින් සිදුකරනු ලැබූ අවස්ථාවකදී පවා, පිරිමින් කළ වරදට වඩා කාන්තාව කළ එම සමාන වරදට වැඩි බරක් යොදා පෙන්වීම සිදුවේ. එය පැහැදිලිවම ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් නොවේදැයි පාඨක අප විමසිය යුතුයි.

ඊට උදාහරණයක් ලෙස ලංකාදීප සහ මව්බිම (10/20) පුවත්පත් තුළ වූ මෙම පුවත් වාර්තාවන් සලකා බැලිය හැක. මෙහිදී සිරස්තල තුළ සඳහන් වන්නේ "කැසිනෝ ගැසූ" කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් වන අතර, අන්තර්ගතය තුළ එම වරදට "කාන්තාවන් දෙදෙනෙකු ඇතුළු පස්දෙනෙකු" අත්අඩංගුවට ගත් බව සඳහන් වේ. මෙසේ මෙම ප්‍රවෘත්තිය තුළ කාන්තාවන් පමණක් ඉස්මතු වී ඇත්තේ මන්ද? එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව ඍජුව කොන් කිරීමක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Mawbima**